සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ප්‍රථම භාගය, 2010-ජනවාරි , 153-173
ISSN 1800-1459

# ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක විග්‍රහයක් (නෙළුව 'මැදගම' ග්‍රාමය ඇසුරෙනි)

**දිලාන් ගුණවර්ධන**

*සමාජීය විද්‍යා අධ්‍යයන අංශය, රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.*

**සාරාංශය**

ශ්‍රී ලාංකාවේ ගැමි සමාජ ව්‍යුහය සහ සංවිධානය තුළ කුලය සහ ඉඩම් භුක්තිය යන විචල්‍යයන් පිළිබඳ ව අධ්‍යයනය කළ දෙස් විදෙස් සමාජ හා මානව විද්‍යාඥයෝ බොහෝ දෙනෙකු (Ryan, 1993., පීරිස්, 1964., Thambiah, 1958., Leach, 1961., Yalman, 1967., Obeysekere, 1967 සහ Spencer, 1990). මෙම විචල්‍යයන් වෙන් වෙන් වශයෙන් ගෙන සමාජයේ සංවිධානය වී ඇති අයුරු අධ්‍යයනය කර ඇති නමුත් මෙම විචල්‍යයන් අතර ඇති සම්බන්ධතාව හඳුනාගැනීම උත්සාහ ගෙන නොමැති බව පැහැදිලි වේ.

මෙහි දී ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර, සම්බන්ධතාවක් පවතී ද? යන අධ්‍යයන ගැටළුව අධ්‍යයනය කිරීම සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදගම ග්‍රාමය තෝරා ගනු ලැබී ය. සාම්ප්‍රදායික ගමක හඳුනාගතහැකි ලක්ෂණ අදටත් ශේෂ ව පවතින ගමක් මෙන් ම විවිධ කුල කිහිපයක් නියෝජනය කරන ජන කොටසක් අදටත් මෙම ගම තුළ දක්නට ලැබේ.

මෙහි දී අධ්‍යයන ක්‍රම වශයෙන් ඓතිහාසික ක්‍රමය තුලනාත්මක ක්‍රමය සහ සංඛ්‍යානාත්මක ක්‍රමය ද ප්‍රයෝජනවත් විය. දත්ත රැස් කිරීමේ දී නිරීක්ෂණය, සහභාගීත්ව නිරීක්ෂණය, සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගනු ලැබී ය. මීට අමතරව ජන සංගණන වාර්තා, ග්‍රාම නිලධාරී වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්තා, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇති වාර්තා ද ප්‍රයෝජනයට ගනිමින් දත්ත එක්රැස් කරන ලදි.

මෙම අධ්‍යයනය මගින් හඳුනාගැනීමට හැකි වූයේ ගැමි සමාජ නවීකරණයත් සමග ගම තුළ විවිධ වෙනස්වීම් සිදුව ඇති බවත් විශේෂයෙන් කුලය හා බැඳුනු තහංචි හා මතවාද යම් ප්‍රමාණයකට අහෝසි වී ගොස් පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන්ට ද සමාජයේ ඉහළ අතට චලනය වීමට ඉඩ ප්‍රස්තා ලැබී ඇති බවත් ය. නමුත් කුලය සහ ඉඩම් හිමිකාරත්වය සම්බන්ධයෙන් පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව ගම තුළ සැලකිය යුතු වෙනසකට භාජනය වී නොමැති බව යි.

**කේන්ද්‍රීය වචන**: කුලය, ඉඩම් භුක්තිය, සමාජ තත්වය, සංචලතාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් මුල්වරට ඉගැන්වීම් ආරම්භ වන්නේ 1949 වර්ෂයේ බ්‍රයිස් රයන් (Bryce Ryan) සහ මරේ ඒ. ස්ට්‍රවුස් (Murray A. Straus) යන ඇමරිකානු සමාජ විද්‍යාඥයන් දෙදෙනාගේ පුරෝගාමීත්වය යටතේ ය (කරුණාතිලක, 1998). මෙසේ ඇමරිකානු අභාසය මත ස්ථාපිත වූ ශ්‍රී ලංකාවේ සමාජ

විද්‍යාව න්‍යායාත්මක වර්ධනයට වඩා ආනුභාවික පර්යේෂණ වලට වැඩි අවධානයක් යොමු කරමින් ගොඩනැගෙන්නට විය. මේ පිළිබඳ ව විග්‍රහ කරන කාංලිග ටියුඩර් සිල්වා, 'ලංකාවේ පමණක් නොව තායිලන්තය, පිලිපීනය වැනි සෙසු ආසියාතික රටවල ද ඇමරිකානු බලපෑමෙන් ආරම්භ වූ සමාජ විද්‍යාව න්‍යායාත්මක ප්‍රවේශයට වඩා පර්යේෂණාත්මක නැඹුරුවකින් ගොඩ නැගෙන්නට වූ බව' (සිල්වා, 2000: 32) සඳහන් කරයි.

මෙවැනි පසුබිමක ආනුභවික අධ්‍යයනයන්ට මුල්තැන දෙමින් බිහි වූ මෙරටේ සමාජ විද්‍යා සම්ප්‍රදාය තුළ දෙස් විදෙස් සමාජ හා මානව විද්‍යාඥයෝ බොහෝ දෙනෙකු (Ryan, 1993., පීරිස්, 1964., Thambiah, 1958., Leach, 1961.,Yalman, 1967., Obeysekere, 1967 සහ Spencer,1990) ලාංකීය සමාජයේ සමාජ ව්‍යුහය සහ සංවිධානය (Social Structure and Organization) පිළිබඳ විවිධ මාතෘකා ඔස්සේ අධ්‍යයනය කිරීමට යොමු වි තිබේ. මෙම බොහෝ අධ්‍යයන සාම්ප්‍රදායික සිංහල ගැමි සමාජය කේන්ද්‍ර කොට ගෙන කරනු ලැබූ ඒවා වේ. මේවා ක්ෂුද්‍ර අධ්‍යයන (micro studies) වශයෙන් සිංහල ගැමි සමාජය තුළ සංවිධානය වි තිබූ පවුල (family) විවාහය (marriage) ඥාතීත්වය (kinship) කුලය (caste) ඉඩම් භුක්තිය (land tenure) සහ ආගම (religion) වැනි විචල්‍යයන් පදනම් කරගෙන කරනු ලැබූ අධ්‍යයන වේ. මෙම තත්ත්වය සමාජ විද්‍යාව විෂයයක් වශයෙන් ආරම්භ වි දශක දෙකක් පමණ ගතවන තෙක් දක්නට ලැබුණු නමුත් 1970 දශකයෙන් පසු සමාජ හා මානව විද්‍යා පර්යේෂකයන් අධ්‍යයනය කළ මාතෘකාවල වෙනසක් සිදු වූ බව දක්නට ලැබේ. විශේෂයෙන් 1971 කැරැල්ලත්, 1983 ජාතිවාදී අරගලයත් යන සිදුවීම් ඒතාක් මෙරටේ පැවති සමාජ පරිසරය කිසියම් වෙනසකට භාජනය කිරීමට හේතුවිය. 1971 සහ 1983 සිදුවීම් ලාංකීය සමාජ හා මානව විද්‍යාත්මක අධ්‍යයනයන්ගේ දියබෙදුමක් (watershed) ලෙස (සිල්වා, 2000) හඳුන්වනු ලබයි. මිට අමතර ව නිදහස් අධ්‍යාපනය, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය වැනි ක්‍රියාමාර්ග හඳුන්වාදීම තුළ සමාජය ප්‍රබල වෙනසකට භාජනය විය. එහෙත් සාම්ප්‍රදායික ගැමි සමාජය කේන්ද්‍ර කොට ගෙන පවුල, විවාහය, ඥාතිත්වය, කුලය, ඉඩම් භුක්තිය සහ ආගම වැනි සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය තේරුම් ගැනීමට උපකාරී වූ සමාජ ආයතන පිළිබඳ කරනු ලැබූ අධ්‍යයන වෙනුවට නූතන සංකීර්ණ සමාජ පරිසරය පිළිබඳ ජාතිකවාදය (nationalism) ජනවාර්ගිකත්වය (ethnicity) ප්‍රචණ්ඩත්වය (violonce) ස්ත්‍රී පුරුෂ සමාජ භාවය (gender) සහ සමාජ වෙනස්වීම් (social Change) වැනි නව තේමාවන් ඔස්සේ බොහෝ අධ්‍යයන සිදු කරන්නට විය. මේ තත්ත්වය මත සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය තුළ කුලය සහ ඉඩම් භුක්තිය යන විචල්‍යයන් බොහෝ සමාජ හා මානව විද්‍යාඥයන්ගේ (Ryan, 1993., සොඩ්රිංටන්, 1980., පීරිස්, 1964., Yalman, 1967., Obeyesekere, 1967 සහ Leach, 1961) අධ්‍යයනයන්ට භාජනය වූවත් නූතන සංකීර්ණ සමාජ පරිසරය තුළ මෙම විචල්‍යයන් පිළිබඳ අධ්‍යයනය කිරීමට වැඩි අවධානයක් යොමු නොකරන බව පැහැදිලි වේ. මේ නිසා වර්තමාන සමාජ ව්‍යුහය තුළ මෙම විචල්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කොට ඒ පිළිබඳ ව විග්‍රහකර බැලීම කාලෝචිත වේ.

මීට අමතර ව මේ රටේ සාම්ප්‍රදායික සමාජ ව්‍යූහය පිළිබඳ අධ්‍යයනය කර ඇති බොහෝ දෙනා කුලය සහ ඉඩම් භුක්තිය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇති බව එම අධ්‍යයනයන් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ. නමුත් ඔවුන් මෙම කුලය සහ ඉඩම් භුක්තිය පිළිබඳ කරන ලද අධ්‍යයනයන් මගින් මෙම විචල්‍යයන් වෙන් වෙන් වශයෙන් සමාජය තුළ සංවිධානය වී තිබූ ආකාරය හඳුනා ගැනීමට උත්සාහ ගෙන තිබේ. විශේෂයෙන් බ්‍රයිස් රයන් සිංහල කුල ක්‍රමය විස්තාරාත්මක ව පැහැදිලි කිරීමට උනන්දු වී තිබේ (1957). පීරිස් විසින් සාම්ප්‍රදායික උඩරට සමාජයේ ක්‍රියාත්මක වූ සමාජ සංවිධානය තුළ කුලය සහ ඉඩම් භුක්තියේ පදනම විග්‍රහ කරනු ලබයි (1956). මේ රටේ ඉඩම් භුක්තිය පිළිබඳ වඩාත් පුළුල් විග්‍රහයක් කරනු ලබන්නේ ගණනාත් ඔබේසේකර විසිනි. රෝම ලන්දේසි නීතිය හඳුන්වා දීමත් සමඟ ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්ති ක්‍රමය කෙරෙහි එය බලපාන ආකාරය සම්බන්ධයෙන් ඔහු විසින් මහඟු අධ්‍යයනයක් කර තිබේ (1967). මීට අමතරව ඊ. ආර්. ලීච් විසින් සාම්ප්‍රදායික වියලි කලාපීය ගැමි සමාජයේ ස්වභාවය හඳුනා ගැනීමට උත්සාහ කරන අතර ඉඩම් භුක්තිය සහ ජල පාලනය වැනි මිනිසුන්ගේ ජීවන පැවැත්ම හා සම්බන්ධ සාධක ඥාති ක්‍රමයේ ස්වභාවය තීරණය කළ අයුරු ඔහු මෙම අධ්‍යයනයෙන් විග්‍රහ කර ඇත (1961). නූර් යාල්මන් කන්ද උඩරට සමාජයේ ඥාති මූලධර්මවලට අමතර ව කුල ක්‍රමය පිළිබඳ ව ද සොයා බැලීමට උත්සාහ ගෙන තිබේ (1967). මීට අමතර ව මේ රටේ සාම්ප්‍රදායික කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ මානව විද්‍යාත්මක වටිනාකමකින් යුත් කරුණු රාශියක් අධිරාජ්‍යවාදී පාලන සමයේ මේ රටේ ජීවත් වූ විදේශීය පරිපාලන නිලධාරීන්ගේ වාර්තා සහ ඔවුන් විසින් රචිත කෘතීන් (Davy, 1983., D'oyly, 1995 සහ Skinner, 1995) මගින් අනාවරණය කරනු ලබයි. නමුත් සියල්ල පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ මෙම සියලු දෙනා කුලය හා ඉඩම් භුක්තිය සාම්ප්‍රදායික සමාජය තුළ ක්‍රියාත්මක වූ ආකාරය වෙන්වෙන් වශයෙන් අධ්‍යයනය කර ඇති නමුත් මේවා අතර ඇති සබඳතාව හඳුනාගැනීමට වැඩි අවධානයක් යොමු කර නොමැති බව යි. නමුත් ක්‍රියාත්මක වීමේ දී මෙම විචල්‍යයන් අතර පැහැදිලි සබඳතාවක් හඳුනාගත හැකි වේ. මේ නිසා කුලය සහ ඉඩම් භුක්තිය ලාංකීය සමාජය තුළ එකිනෙකට බද්ධ වී ඇති විචල්‍යයන් දෙකක් ලෙස හඳුනාගෙන මේවා අතර ඇති සබඳතාව සොයා බැලීම වැදගත් වේ.

මේ අනුව ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධතාව ය සොයා බැලීම සඳහා සාම්ප්‍රදායික සිංහල සමාජයේ ඉඩම් භුක්තිය පිළිබඳ කරන ලද ඉතාමත් අගනා මානව විද්‍යාත්මක අධ්‍යයනයක් ලෙස (Obeyesekere, 1967) පදනම් කරගෙන ඉඩම් භුක්තිය කුලයත් සමඟ සම්බන්ධ වී තිබූ ආකාරයත් නූතනයේ එය කෙතරම් දුරට වෙනස් වී ඇති ද යන්නත්, එසේ වෙනස් වීමට බලපාන ලද හේතු සාධක සොයා බැලීමටත් මෙහි දී උත්සාහ ගන්නා ලදී.

## ගැටළුව

මේ අනුව, කුලය සහ ඉඩම් භුක්තිය යන විචල්‍යයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට මෙම විචල්‍යයන් අතර ඇති සම්බන්ධය කෙබඳු වේ ද? යන්න සොයා බැලීමට මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් අවධානය යොමු කරන ලදී. මෙහි දී පර්යේෂණය

ඉදිරියට සිදු කර ගෙන යාම සඳහා අධ්‍යයන ගැටළුව වශයෙන් ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර, සම්බන්ධතාවක් පවතී ද? යන අධ්‍යයන ගැටළුව ගොඩනගා ගනු ලැබී ය.

ඉහත ගැටළුව පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම ඡන්ද කොට්ඨාසයේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැදගම ග්‍රාමය තෝරා ගනු ලැබී ය. ශ්‍රී ලංකාවේ ගැමි සමාජ පිළිබඳ කරනු ලැබූ අධ්‍යයන අතර, ගණනාත් ඔබේසේකරගේ අධ්‍යයනය (1967) සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගනු ලැබුයේ ද. මැදගම ග්‍රාමය යි. ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් මානව විද්‍යාත්මක වටිනාකමක් හිමි එම අධ්‍යයනය සඳහා පාදක වූ මැදගම ග්‍රාමය ඉඩම් භුක්තිය සහ කුලය අතර පවතින සම්බන්ධය හඳුනා ගැනීම සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගනු ලැබී ය.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රම විද්‍යාව තුළ හඳුනාගත හැකි අධ්‍යයන ක්‍රම අතරින් මෙහි දී අධ්‍යයන ක්‍රම තුනක් උපයෝගී කර ගනු ලැබී ය. ගමේ ඓතිහාසික පසුබිම සහ ගමේ ක්‍රමික විකාශනය හඳුනා ගැනීම සඳහා ඓතිහාසික ක්‍රමය ද, සාම්ප්‍රදායික අවධියේ කුලය සහ ඉඩම් භුක්තිය සංවිධානය වී තිබූ ආකාරය වර්තමානයේ කෙබඳු ස්වරූපයක් ගෙන තිබේ ද යන්න සංසන්දනාත්මක ව විමසා බැලීමට තුලනාත්මක ක්‍රමය ද, ඉඩම් භුක්තිය හා කුල ක්‍රමය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමේ දී සහ විශ්ලේෂණය කිරීමේ දී සංඛ්‍යානාත්මක ක්‍රමය ද ප්‍රයෝජනවත් විය. ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් ආශ්‍රයෙන් මෙම අධ්‍යයනය සැලසුම් කළ බැවින් දත්ත රැස් කිරීමේ දී ගුණාත්මක දත්ත රැස් කිරීමේ ශිල්පක්‍රම කෙරෙහි අවධානය යොමු කරන ලදී. මේ අනුව නිරීක්ෂණය, සහභාගීත්ව නිරීක්ෂණය, සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගනු ලැබී ය. සම්මුඛ සාකච්ඡාවේ දී විශේෂයෙන් ගමේ තෝරාගත් පුද්ගලයින් සහ තෝරාගත් පුද්ගල කණ්ඩායම් ආශ්‍රයෙන් දත්ත ලබා ගතිමි. මීට අමතර ව ජන සංගණන වාර්තා, ග්‍රාම නිලධාරී වාර්තා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්තා, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇති වාර්තා ද ප්‍රයෝජනයට ගනිමින් දත්ත එක්රැස් කරන ලදී.

මේ ආකාරයට කුලය සහ ඉඩම් භුක්තිය අතර පවතින සම්බන්ධතාව මැදගම ග්‍රාමය ආශ්‍රය කරගනිමින් අධ්‍යයනය කිරීමේ දී සාම්ප්‍රදායික මැදගම ඉඩම් භුක්තිය සහ කුල නියෝජනය පහත ආකාරයට හඳුනාගත හැකි වෙයි.

## සාම්ප්‍රදායික මැදගම ඉඩම් භුක්තිය හා කුල නියෝජනය

1950 දශකය පමණ වන විට මැදගම ග්‍රාමයේ ක්‍රියාත්මක වූ අර්ථ ක්‍රමය මුළුමනින් ම කෘෂිකර්මාන්තය මත රඳා පැවති බව පැහැදිලි වේ. මේ ලෙස ගැමි අර්ථ ක්‍රමය ගොවිතැන මත තීරණය වූ බැවින් ඉඩම් වටිනා සම්පතක් විය. විශේෂයෙන් තෙත් කලාපයේ ගැමියන්ගේ ප්‍රධාන ආදායම් මූලය ඉඩම් බව නුර් යාල්මාන් පවා සඳහන් කරන අතර ඒ මගින් මෙය තවදුරටත් තහවුරු වේ (Yalman, 1967: 36).

සාම්ප්‍රදායික අවධියේ මැදගම අයත් හිනිදුම් පත්තුව කඳු, හෙල් සහ බෑවුම්වලින් යුත් දුෂ්කර ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි වේ. මුහුදු මට්ටමේ සිට උස මීටර් 470 ක් පමණ ද, වර්ෂයකට අඟල් 150 - 200 අතර පවතින අධික වර්ෂාපතනය ද වැනි භූගෝලීය හා කාලගුණික පසුබිම ඉඩම් භුක්තියේ විවිධ ස්වරූප ගැනීමට හේතු වී තිබේ (Obeyesekere, 1967: 03).

මෙවැනි පසුබිමක හිනිදුම් පත්තුවේ උතුරු ප්‍රදේශයට අයත් මැදගම ග්‍රාමය භූමිය වශයෙන් ගත් කල ඉතා සීමිත ප්‍රමාණයක් විය. සමස්ත ඉඩම් ප්‍රමාණය ම අක්කර සියයක් (100) පමණ වන අතර ඉන් අක්කර 60 ක් ගොඩ ඉඩම් වන අතර සෙසු අක්කර 40 ක ප්‍රමාණය කුඹුරු ඉඩම් වේ. මෙම ඉඩම් ප්‍රධාන වශයෙන් ඉහළ මැදගම හා පහළ මැදගම යන කොටස් දෙකට අයත් වූ අතර ප්‍රවේණි. ඉඩම් වශයෙන් ඉහළ මැදගම අක්කර 16 ක් පමණ ද පහළ මැදගම ගොඩ ඉඩම් අක්කර 24 ක්ද කුඹුරු ඉඩම් අක්කර 14 ක් ද පැවතුණි (Obeyesekere, 1967: 07).

කුඹුරු ගොවිතැන් කිරීමේ දී අවුරුද්ද ප්‍රධාන වශයෙන් යල හා මහ වශයෙන් කොටස් දෙකකට බෙදනු ලබයි. මහ කන්නයෙන් වර්ෂය ආරම්භ වන අතර වගා කරනු ලබන කාලය ඔක්තෝබර් දෙවන සතියත් නොවැම්බර් පළමු සතියත් දක්වා කාලය වේ. අස්වැන්න නෙළනු ලබන්නේ ජනවාරි හතරවන සතියත් පෙබරවාරි දෙවන සතියත් අතර කාලය තුළ ය. අස්වැන්න නෙළීමේ දී පිරිමි කෙනෙකුට වී කුරණි 03 ක් ගෙවනු ලබයි. කුඹුරු වැඩවල දී තේ දෙසැරයක් දෙනු ලබයි. උදේ, දවල් ආහාරය ද ඇතැම් විට රාත්‍රියට ආහාර ද ලබා දිය යුතු වේ.

අත්තමට අමතර ව කයිය නැමති ක්‍රමය ද ක්‍රියාත්මක වේ. මෙකල බොහෝ ගැමියන් කුඩා කොටස් වශයෙන් කුඹුරු ඉඩම් වගා කරනු ලබන අතර එක් කෙනෙකුගේ කුඹුරක සෙසු සියලු කොටස් හිමියෝ සහයෝගයෙන් වගා කටයුතුවලට උදව් කරති. ඊට හිලව් වශයෙන් ඔහු ද සෙසු අයගේ කුඹුරු වැඩ සඳහා සහයෝගය ලබා දිය යුතු වේ. කයිය ක්‍රියාත්මක වීමේ දී ඉඩම් හිමියා තේ සහ ආහාර සෙසු ගොවියන්ට ලබාදීම සිදු කළ යුතු ය (Obeyesekere, 1967: 8).

මෙම අවධියේ දී සරල මිනුම් ක්‍රම දක්නට ලැබුණි. අස්වැන්න මනිනු ලබන කුඩා ම ඒකකය කුරණිය වේ.

| | |
|---|---|
| කුරණි 08 | බුසල් 01 |
| කුරණි 10 | පැල් 01 |
| පැල් 04 | අමුණු 01 |
| කුරණි 14 ක් වපුරන බිමක් | අක්කර 01 |

කුඹුරු ගොවිතැනේ දී අඳය සාම්ප්‍රදායික මැදගම එතරම් ප්‍රචලිත දෙයක් නොවුණි. යම් හෙයකින් අඳ කුඹුරක් තිබුණහොත් අඳ ගොවියා අස්වැන්නෙන් 1/5 ක් ඉඩම් හිමියාට ලබාදිය යුතු ය. විශේෂයෙන් මැදගම කුඹුරු ගොවිතැන් කිරීමේ දී තට්ටු මාරු හා කට්ටිමාරු ක්‍රම ක්‍රියාත්මක බැවින් මෙම අඳ ගොවිතැන් ක්‍රමය එතරම් ව්‍යාප්ත ව නොමැත.

කුඹුරු ඉඩම්වල වටිනාකම මෙකල ඉතා සීමිත විය. 1960 වන විට වී මල්ලක කුඹුරක් (අක්කරයක්) රු. 200 ක් පමණ වේ. වී බුසලක් රු. 56 ක් පමණ වී ඇත. 1930 දී වී මල්ලක් රු.9.60 ක් වූ අතර හාල් සේරු එකක් ශත 40 ක් පමණ වී තිබේ.

කුඹුරු ඉඩම් හිමිකාරත්වය විමසා බැලීමේ දී මැදගම සියලු ඉඩම් ගොවිකුලය සතු වූ බව කිව යුතු ය. ඔබේසේකර පවා සඳහන් කරන්නේ මැදගම සියලු දෙනා ගොවි කුලයට අයත් බවත් මේ ගම් ජාතිකාරයෝ නැති පිරිසිදු ගම් ලෙස යි (Obeyesekere, 1967: 102).

සාම්ප්‍රදායික මැදගම ඉඩම් හිමිකාරත්වය හා භුක්තිය පිළිබඳ තවදුරටත් විමසීමේ දී ගැමියන් සතු ගොඩ ඉඩම් පිළිබඳ ව ද හඳුනා ගැනීම වැදගත් වේ. ගැමියන් සතු ගොඩ ඉඩම්වල ගැමියන් ප්‍රධාන වශයෙන් පුවක්, රබර්, පොල්, කොස්, දෙල්, අඹ, දෙහි, දොඩම්, අන්නාසි හා කෙසෙල් වගා කර තිබේ. මෙකල පුවක් ප්‍රධාන වැවිලි බෝගය වූ අතර, පුවක් ගෙඩි 25 ක් ශත 10 ක් පමණ වේ. බොහෝ විට පුවක් එකතු කිරීමට වෙළෙන්දෝ ගෙවල්වලට එන අතර ඔවුන්ට පුවක් විකුණා ඒ වෙනුවට ගෙදරට අවශ්‍ය බඩු ඔවුන්ගෙන් මිළ දී ගනු ලබයි. මීට අමතර ව රබර් වගාව ද ගැමියන් අතර, වැවිලි වගාවක් ලෙස මෙකල දක්නට ලැබුණි. රබර් රොටී රාත්තලක් ශත 4045 ක් වූ අතර, රබර් රොටී ඇඹරීම සඳහා එක් රොටියකට ශත 1 ක් ගෙවීමට සිදු විය. රබර් රෝලක් රු. 250/ පමණ වී ඇත.

මැදගම ග්‍රාමයේ තේ ආර්ථිකය ඉතා ශක්තිමත් ආකාරයෙන් ව්‍යාප්ත වන්නේ වර්ෂ 1972 න් පසු ව ය. 1940-50 වසරවල තේ වගාවක් ලෙස පැවැතිය ද 1982 මැදගම තේ කර්මාන්ත ශාලාව ආරම්භ වීමත් සමග ගැමියන්ගේ ප්‍රධාන ගෙවතු වගාව බවට පත් ව තිබේ. මීට පෙර සාම්ප්‍රදායික අවධියේ තේ අක්කර 40 ක් පමණ වගා කර තිබේ. එකල සතියකට දළු රාත්තල් 20-25 ක් කඩා ගත හැකි විය. දළු රාත්තලක් ශත 9 ක් පමණ වී තිබේ. මාසයක් දළු දුන් විට රු. 90/ ක මුදලක් ලැබිය හැකි විය. දළු කුලියට කැඩුවහොත් කුලිය වශයෙන් ශත 70-75 ක් දිනකට ගෙවිය යුතු විය. සාමාන්‍යයෙන් ගොඩ ඉඩමක කුලියට වැඩ කරන්නේ නම් දිනකට රු 200 - 250 ත් අතර ගෙවිය යුතු විය. දළු කඩන එක බොහෝ විට පවුලේ සාමාජිකයන් විසින් ම සිදු කරන ලදි. මුල් කාලයේ ලොකු තේ ගස්වලින් ඇට අරගෙන තවාන් දමා ඒ මගින් තේ පැළ සාදා ගත් අතර පසුව තේ රිකිලි මගින් පැළ සාදා ගැනීම සිදු කර තිබේ.

තේ පැලයක් ශත 5 ක් වූ අතර, තේ අක්කරයකට පැළ 3000 ක් පමණ අවශ්‍ය වේ. මෙකල ගොඩ ඉඩම්වල වටිනාකම ද ඉතා සීමිත වූ අතර ගොඩ ඉඩම් අක්කරයක් රු 20-25 අතර ප්‍රමාණයකි.

සාම්ප්‍රදායික මැදගම ගැමියන් කුඹුරු සහ ගොඩ ඉඩම්වල වගා කිරීම හැරුණු විට හේන් ගොවිතැනේහි ද නිරත වී තිබේ. මෙකල හේන් ගොවිතැන සඳහා ඉඩමක් තෝරා ගැනීමට ගැටළුවක් නො තිබුණි. එකවර ගමේ කිහිපදෙනෙක් හේන් කෙටීමට යෑම සිරිතකි. හේන් ගොවිතැන් කිරීමේ දී ලංකාවේ ගැමියන් සියලු දෙනා ම සහයෝගයෙන් හේන් ගොවිතැනට සම්බන්ධ වූ බව (Spencer, 1990: 125) සඳහන් කරයි. මැදගම ද මෙම තත්වය වඩා හොඳින් ක්‍රියාත්මක වී තිබේ. හේන් ගොවිතැන් කිරීමේ දී ජනවාරි සහ පෙබරවාරි මාසවල වල් නෙළීමෙන් අනතුරුව මාර්තු මාසයේ හේන් වපුරනු ලබයි. මෙම හේන් ඉඩම්වල කුරක්කන්, අමු, මෙනේරි, පොලයල් ආදියත් ඊට අමතර ව මඤ්ඤොක්කා, අල, බතල වැනි භෝග වගා කර තිබේ. ගෝන්නු, ඌරෝ, ඉත්තෑවෝ වැනි සතුන්ගෙන් ආරක්ෂා කිරීමට හේන වටේට වැටක් බැඳීම (කඳ වැට බඳිනවා) අනිවාර්ය අංගයක් විය. ඊට අමතර ව රෑට පැල් රැකීමත් ගැමියන්ගේ සිරිත විය. සාමාන්‍යයෙන් හේනක් එකවරක් හෝ දෙවරක් වගා කරන්න පුළුවන් නමුත් ඉන් පසුව හේන් ඉඩමේ හිමිකාරත්වය සම්බන්ධයෙන් ඔහුට අයිතියක් නොමැත. මේ ආකාරයට සාම්ප්‍රදායික මැදගම ඉඩම් හිමිකාරත්වය සම්බන්ධයෙන් විමසීමේ දී එක්එක් පුද්ගලයාට වෙන්වෙන් වශයෙන් හිමි වූ ඉඩම් ප්‍රමාණය පිළිබඳ පැහැදිලි අදහසක් ලබාගත නොහැකි වුවත් මෙකල පැවති ඉඩම් ප්‍රමාණය භුක්ති විඳි ස්වරූපය සම්බන්ධයෙන් දළ අවබෝධයක් මෙමගින් ලබා ගත හැකි වේ. විශේෂයෙන් ගැමියන් මෙහි දී තම ඉඩම් කුඹුරු, ගොඩ හා හේන් ඉඩම් වශයෙන් ප්‍රධාන වශයෙන් වගා කර තිබේ.

සාම්ප්‍රදායික මැදගම, කුලය පිළිබඳ විමසීමේ දී ගමේ ඉතා වැදගත් අංගයක් ලෙස කුල ක්‍රමය ක්‍රියාත්මක වූ අයුරු හඳුනාගත හැකි වේ. 1961 වන විට ගමේ මුළු ජනගහනය 289 ක් වූ අතර මොවුන් පවුල් 47 කට අයත් වූ බව පැහැදිලි වේ (Obeysekere, 1967: 08). මැදගම කුලය පිළිබඳ විග්‍රහයේ දී විශේෂත්වය වන්නේ මෙම සියලු ම දෙනා ගොවිකුලයට අයත් වීමයි. මැදගම ග්‍රාමයේ සියලු දෙනා ගොවිකුලයට අයත් වූ අතර ඔවුන් බෞද්ධයෝ වූ බව ඔබේසේකර සඳහන් කරයි (Obeysekere, 1967: 102). මෙම නිසා ගැමියන් අද පවා 'අපේ ගම පිරිසිදු ගමක්, ජාතිකාරයෝ නැති ගමක්' වශයෙන් හඳුන්වති.

ගොවිකුලය විවිධ උපකොටස්වලින් සමන්විත වුව ද මැදගම සිටින ගොවිගම කුලයට අයත් පිරිස වගා කටයුතු කරන භූමියේ හිමිකාරත්වයක් හිමි නිදහස් ගැමියන් (free peasants) පිරිසක් බව ඔබේසේකර සඳහන් කරයි (Obeysekere, 1967: 16).

මේ ආකාරයට මැදගම ගැමියන් සාම්ප්‍රදායික අවධියේ ගොවිගම කුලය නියෝජනය කරන පිරිසක් පමණක් වීම විමසා බැලිය යුතු ය. මැදගම අයත් හිනිදුම් පත්තුව තුළ ඇතැම් ගම්වල විවිධ කුලවලට අයත් පුද්ගලයෝ ජීවත් වේ. විශේෂයෙන් ගම පුළුල් කිරීමේ ව්‍යාපාරයත් (village expansion scheme) සමඟ විවිධ ප්‍රදේශවලින් තරුණ පිරිස් ගම්වල පදිංචි කළ බව දක්නට ලැබේ. 1970 දී සිරිමාවෝ බණ්ඩාරනායක රජය සමය තුළ යටිටපාත ප්‍රදේශයේ සිරිමා උද්‍යානය, මණ්ඩලපුර, තරුණකැල්ල, බටුවංගල, හල්විටිගල, හප්පිටිය, දාම්මල සහ කළුබෝවිටියන යන ගම්වල මෙසේ ජනපද ඇතිකිරීමත් සමඟ විවිධ කුලවලට අයත් පිරිස් මෙම ගම්වල දක්නට ලැබේ. අදටත් මැදගම අවට රදාගොඩ, බෙරවගොඩ, නවම්ගොඩ වැනි නම්වලින් ප්‍රදේශ හඳුනාගැනීමට හැකි වේ. මෙම ගම්වල පහත් යැයි සම්මත කුලවලට අයත් පිරිස් අදටත් ජීවත් වේ. නමුත් මැදගම පිරිසිදු ගමක් වශයෙන් පැවතීමට බොහෝ සෙයින් හේතු වී ඇත්තේ සාම්ප්‍රදායික අවධියේ විශේෂයෙන් 1950 - 60 කාලයේ දී මෙම ගමට ද පිටස්තර තරුණ කණ්ඩායම් රැගෙන විත් ජනපදයක් ඇති කිරීමට උත්සාහ කළත් ගැමියන් ඊට විරුද්ධ වීම නිසා ය. මෙම ජනපදය ඇති කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමට තනන ලද ජනපද කාර්යාලය (community office) ද අදටත් ගමෙහි දක්නට ලැබේ.

ගමෙහි ගොවිකුලය පමණක් සිටීම තුළ සියලු ම ඉඩම් මෙකල ගොවිකුලය සතු විය. කෙසේ වෙතත් ගොවිකුලය පමණක් ජීවත් වුවත් අවට ගම්වල ජීවත් වූ පහත් යැයි සම්මත කුලවල පිරිස් ගම සමඟ සෘජු සබඳතා පැවැත්වූ බව පැහැදිලි වේ. ගැමියන්ගේ අවශ්‍යතා වෙනුවෙන් බෙරව, හේන සහ නවම්දන්න කුලවල පිරිස් නිතර ගැමියන් සමඟ සබඳතා පවත්වති.

විශේෂයෙන් තොවිල් පවිල් කටයුතුවලට බොහෝ පිරිස් පැමිණ තිබේ. කැළෑබද දුෂ්කර ප්‍රදේශයක් වූ මැදගම යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සාමාන්‍ය අංගයක් වූ බව ගැමියෝ සඳහන් කරති. මෙසේ තොවිල්වලට පන්දම් එතීමට, බෙර ගැසීමට, පිටස්තර අය ගමට පැමිණ තිබේ. මීට අමතර ව විවාහයක දී කොටහළු මංගල්‍යයක දී මරණයක දී වැනි අවස්ථාවන්හි දී මෙම විවිධ කුලවලට අයත් පිරිස් ගමට පැමිණීම සිදු ව තිබේ. හේනේ මාමා හේනේ නැන්දා නිතර ගමට පැමිණෙන බවත් රෙදි ඇපිල්ලීම සඳහා ඒ අයට අවුරුද්දටම රු. 10.00 ක මුදලක් දුන් බවත් ගැමියන් සඳහන් කරයි. මරණ ගෙදරක බෙර ගැසීම වෙනුවෙන් කන්න බොන්න ලබා දී රු. 500 ක මුදලක් ගෙවන ලදී.

සාම්ප්‍රදායික අවධියේ කුල බලපෑම් ඉතා හොඳින් ගම තුළ ක්‍රියාත්මක වී තිබේ. අන්තර් කුල විවාහ මෙකල සිදු නොවූ අතර බොහෝ විට නෑනා මස්සිනා විවාහ සිදු ව තිබේ. පහත් කුලයක කෙනෙක් ගෙදරට පැමිණි විට විශේෂ පිඟානත්, කෝප්පයක් ඔවුන් වෙනුවෙන් වෙන් කොට තැබීම ගැමියන්ගේ සිරිත ය. මෙය උඩකින් නොතිබූ අතර බොහෝ විට අල්මාරිය යටින් තබන බව ගැමියෝ පවසති. ආහාර ගැනීමේ දී එකට සිට ආහාර ගැනීමක් මෙකල සිදු නොවුණි.

ආමන්ත්‍රණයේ දී කුල බේදය දක්නට තිබූ බව පැහැදිලි වේ. අඩු කුලයේ යැයි සම්මත අය ගොවිගම කුලයේ අයට ආමන්ත්‍රණය කළේ රාළහාමි, මහත්තයා ආදී යෙදුම් මගිනි. ගොවි කුලයේ අය පහත් අය ආමන්ත්‍රණය කළේ පුද්ගල නාමයන්ගෙනි. මෙකල අඩු කුලයේ පිරිස් හඳුන්වන්න තිබුණු පුද්ගල නාම අතර,

| | |
|---|---|
| පිරිමි | උපාරිස්, අසිරිංග, අබයා, එමානිස් |
| ගැහැණු | පන්තිනා, පොඩිනා, පේදී යන නම් භාවිත විය. |

ගොවි කුලයේ අය අතර ආමන්ත්‍රණය සිදු වුණේ මාමණ්ඩි, අම්මණ්ඩි යන නම්වලිනි. නමුත් නැන්දේ, මාමේ කියනවාට ගැමියෝ කැමැත්තක් නොදක්වති. මන්දයත් නැන්දේ, මාමේ යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ රජක කුලයේ අය සඳහා වන බැවිනි. නැන්දම්මා යනුවෙන් ඇමතීම වරදක් නොවුණි.

ඉඩම් භුක්තිය සහ කුලය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව විමසා බලන විට පහත් කුලවල පිරිස් මැදගම ග්‍රාමයේ කිසිදු බිම් කොටසකට උරුමකම් නොකියූ බව විශේෂ කරුණකි. විශේෂයෙන් අඳයට වගා කටයුතු සඳහා පහත් කුලවල පුද්ගලයන් සම්බන්ධ නොවූ බව පැහැදිලි වේ. නමුත් කුලී ශ්‍රමිකයන් වශයෙන් බොහෝ විට පහත් කුලවල පුද්ගලයෝ අවට ගම්වලින් මැදගමට පැමිණ තිබේ. විශේෂයෙන් වතු වැඩවලට සහ විශේෂිත උත්සවවල දී මෙසේ පහත් කුල පිරිස් ගමට සම්බන්ධ වෙති. අදටත් පිඟන් කොප්ප සේදීමට මෙම පිරිස් ගමට පැමිණෙන බව ගැමියන්ගේ අදහස යි.

මේ ආකාරයට සාම්ප්‍රදායික සමාජ අවධියේ මැදගම ග්‍රාමයේ ඉඩම් භුක්තිය හා කුල ක්‍රමය ක්‍රියාත්මක වූ අයුරු කෙබඳු ස්වරූපයකින් ගොඩ නැඟුණේ ද යන්න ඉහත සමස්ත විග්‍රහය මගින් පැහැදිලි වේ. විශේෂයෙන් ගැමියන් සියලු දෙනා ම ගොවි කුලය නියෝජනය කළ බැවින් සියලු ඉඩම් ඔවුන් සතු වූ අතර පිටස්තරයින් ගමට පැමිණීම සම්බන්ධ ව ඔවුන් තුළ තිබූ විරෝධය ගම ඒකීය කුලයක් ඔස්සේ සංවිධානය වීමට ප්‍රබල හේතුවක් වී තිබේ. මේ නිසා ගමේ පිටස්තර කුලවල පිරිස් ස්ථිර පදිංචියක් දැකිය නොහැකි ය. නමුත් ගමේ ගැමි අවශ්‍යතාවන් වෙනුවෙන් අවට ගම්වලින් ඔවුන් නිරන්තර ගැමියන් සමඟ සමීප සබඳතා පැවත් වූ බව ගැමියෝ සඳහන් කරති.

මින් අනතුරුව සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව මැදගම ග්‍රාමය තුළ නූතනය වන විට ඉඩම් භුක්තියේ හා කුල නියෝජනයේ සිදු ව ඇති වෙනස්වීම් පිළිබඳ හඳුනාගැනීම වැදගත් වේ.

## නූතන මැදගම ඉඩම් භුක්තිය හා කුල නියෝජනය

වර්තමානයේ ද මැදගම ගැමියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය මත රඳා පවතින බව හඳුනාගත හැක වේ. මේ වන විට සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව ගැමියන් කුඹුරු ගොවිතැන හා ගෙවතු වගාවෙහි නිරත වන බව දක්නට ලැබේ. අද

හඳුනාගත හැකි විශේෂතම ලක්ෂණය වන්නේ ගැමියන් වැවිලි භෝග වගාවන් වශයෙන් තේ වගාව සඳහා යොමු ව තිබීම යි. ගොඩ ඉඩමක් ගත් විට නිවස හැරුණු විට ඉතිරි සියලු භූමිය තුළ තේ වගා කොට තිබේ. මේ නිසා වාණිජ බෝග වගාවක් වශයෙන් තේ වගාව ව්‍යාප්ත වී ඇති අතර ගම තුළ තැනින් තැන ස්ථාන කීපයක රබර් වගාව ද දක්නට ලැබේ. මීට අමතර ව ගැමි ඉඩමක පොල්, පුවක්, කොස් දෙල්, කෙසෙල් ආදිය ව්‍යාපාරික පදනමකින් තොර ව යම් තරමකට දක්නට ලැබේ. කුඹුරු සහ ගොඩ ඉඩම් හැරුණු කොට හේන් ගොවිතැනෙන් අද ගැමියෝ සම්පූර්ණයෙන් ම ඉවත් ව සිටී. විශේෂයෙන් ගමට ආසන්නයේ ඇති සිංහරාජ වනාන්තරය රක්ෂිත වනයක් බවට පත් කිරීම මේ සඳහා ප්‍රබල හේතුවක් වේ. එමෙන් ම සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව සිදු වූ ජනගහන වර්ධනය හා ඊට සාපේක්ෂ ව සිදු වූ ජනාවාසකරණය නිසා තිබූ කැළෑ බිම් එළිකරනු ලැබූ අතර මෙය ගැමියන්ට හේන් ගොවිතැන සඳහා තිබූ ඉඩකඩ ඇහිරී යාමට බලපාන ලදී.

මැදගම ග්‍රාමයේ වර්තමාන ඉඩම් හිමිකාරිත්වය සලකා බලන විට ඒවා ප්‍රධාන වශයෙන් කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් වශයෙන් දක්නට ලැබේ.

ඉහත විග්‍රහය අනුව ගැමියන් සතු මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 75 ක් පමණ වේ. ඉන් අක්කර 19 ක් පුරන් කුඹුරු ලෙස මීට අවුරුදු 5 ට පමණ පෙර සිට වගා කිරීමක් සිදු නොවේ. ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 467 ක් පමණ වේ. මේ අනුව ගැමියන්ගේ මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 542 කි. සාම්ප්‍රදායික අවධියේ ගැමියන් සතු කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 40කි (Obeysekere, 1967: 07). නූතනයේ එය අක්කර 56 දක්වා වර්ධනය වී තිබේ. එමෙන් ම් 1961 වන විට ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 60 කි (එම, 1967: 07). අද එය අක්කර 467 දක්වා වර්ධනය වී තිබේ. මේ අනුව 1961 සාපේක්ෂව කුඹුරු ඉඩම් 40% න් වර්ධනය වී ඇති අතර ගොඩ ඉඩම් 678% ක් වර්ධනය වී තිබේ (වගු අංක 1).

**වගු අංක 1. වර්තමාන මැදගම කුඹුරු හා ගොඩ ඉඩම් ප්‍රමාණය**

| ඉඩම් වර්ගය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| කුඹුරු ඉඩම් වගා කරන | 56 | 10.3 |
| කුඹුරු ඉඩම් වගා නොකරන (පුරන්) | 19 | 3.5 |
| ගොඩ ඉඩම් | 467 | 86.2 |
| එකතුව | 542 | 100.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත 2006

මේ ආකාරයට 1961 ට සාපේක්ෂව ඉඩම් ප්‍රමාණය වර්ධනය වීමට හේතූන් ගණනාවක් බලපා තිබේ. ප්‍රධාන වශයෙන් 1961 ජනගහනය 289 කි (එම 1967 8) එය අද වන විට 1040 දක්වා වර්ධනය වී තිබේ. පවුල් සංඛ්‍යාව 1961 දී 47 ක් වූ අතර අද එය 304 ක් දක්වා වර්ධනය වීමත් සමඟ අලුතින් පදිංචිකරුවෝ බිහි වී තිබේ. විශේෂයෙන් 1963

දී සරත් අමුණුගම මහතා ගාල්ල උපදිසාපති ව සිටිය දී ගමට අක්කර සියයක් ලබා දී පවුල් 50 ක් පදිංචි කර තිබේ. මීට අමතර ව 1977 දී නිවාස කන්ද නිවාස යෝජනා ක්‍රමය හඳුන්වා දී පවුලකට අක්කර 1/4 ක් බැගින් ලබා දී පවුල් 40 ක් පමණ මෙහි පදිංචි කර තිබේ. මීට අමතර ව රජය විසින් ස්වර්ණ භූමි ඔප්පු හා ජයභූමි ඔප්පු මගින් ඉඩම් අහිමි පවුල්වලට ඉඩම් ලබා දීම වැනි හේතු මේ අතර ප්‍රධාන වේ. මේ තත්වය මත වර්තමාන මැදගම පවුල් සංඛ්‍යාව 304 ක් වන අතර ඔවුන්ගේ ඉඩම් අයිතිය පහත සඳහන් පරිදි වේ.

පහත වගු අංක 2 අනුව මැදගම මුළු පවුල් සංඛ්‍යාවෙන් (304) 74% ට තම ඉඩමේ නිශ්චිත හිමිකාරත්වය මේ වන විට හිමි ව පවතින බව පැහැදිලි වේ. සෙසු පවුල් සංඛ්‍යාව එනම් 26% ට ස්ථිර ඉඩම් කොටසක් නොමැති වුවත් අනවසර හෝ බදු ඉඩම් වශයෙන් ඔවුහු පදිංචි ව සිටිති.

**වගු අංක 2. නූතන මැදගම ඉඩම් අයිතිය, පවුල් අනුව**

| ඉඩම් වර්ගය | ප්‍රමාණය (අක්කර) | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 246 | 44 | 14.5 |
| ජයභූමි ඉඩම් | 164 | 124 | 40.8 |
| බලපත්‍ර ඉඩම් | 100 | 56 | 18.4 |
| අනවසර ඉඩම් | 32 | 74 | 24.3 |
| ඉඩම් නොමැති | | 06 | 2.0 |
| එකතුව | 542 | 304 | 100 |

මූලාශ්‍රය ක්ෂේත්‍ර දත්ත 2006

නූතන මැදගම ඉඩම් හිමිකාරත්වය තව දුරටත් විමර්ශනය කර බැලීමේ දී සමස්ත කුඹුරු ඉඩම් සහ ගොඩ ඉඩම් ප්‍රමාණය ඒ ඒ ඉඩම් හිමියන් අතර බෙදී ගොස් ඇත්තේ මෙසේ ය (වගු අංක 3).

**වගු අංක 3. නූතන මැදගම ඉඩම් හිමිකාරත්වය**

| අයිති වූ ඉඩම් කොටසේ ප්‍රමාණය(අක්කර) | ඉඩම් හිමියන් සංඛ්‍යාව හා එහි ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|
| | ගොඩ ඉඩම් | ප්‍රතිශතය | කුඹුරු ඉඩම් | ප්‍රතිශතය |
| > 1/4 | 01 | 1.0 | 0 | 0 |
| 1/4 1/2 | 52 | 16.6 | 0 | 0 |
| 1/2 1 | 44 | 14.0 | 12 | 24 |
| 1 2 | 111 | 35.2 | 33 | 66 |
| 2 5 | 95 | 30.2 | 05 | 10 |
| < 5 | 09 | 3.0 | 0 | 0 |
| එකතුව | 315 | 100.00 | 50 | 100.00 |

මූලාශ්‍රය ක්ෂේත්‍ර දත්ත 2006

මීට ඉහත වගු අංක 2 පෙන්වා දී ඇති පරිදි මැදගම සමස්ත ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 467 කි. මෙම සමස්ත ඉඩම් ප්‍රමාණය බෙදී ගොස් ඇත්තේ පුද්ගලයන් 315 ක අතර වේ (වගු අංක 3) මේ අනුව ගොඩ ඉඩම් හිමිකාරත්වයේ සාමාන්‍යය අක්කර 1 1/2 ක් පමණ වේ. කෙසේ වෙතත් මුළු ගොඩ ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 1 ට වඩා වැඩි ප්‍රමාණය 68% (215) කි. අක්කර 2 ට වැඩි පුද්ගල සංඛ්‍යාව 104 කි (33%). මොවුන් ආදායම් අතින් ඉතා ඉහළ මට්ටමක ජීවත් වන පිරිස වේ. මන්දයත් ගොඩ ඉඩම් සියල්ල බොහෝ දෙනා තේ වගාව සඳහා යොදා ගනු ලබති. මේ නිසා තේ ආර්ථිකය ශක්තිමත් ආයෝජනයක් වන අතර ගැමියන් තේ අක්කර 2 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තමා සතු කරගෙන පවතී නම් එය ඔහුගේ හෝ ඇයගේ ආර්ථික ශක්තිය පිළිබිඹු කරන කැඩපතකි. ඉහත වගු අංක 03 අනුව සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 56 කි. මෙම කුඹුරු ඉඩම් සියල්ල බෙදී ගොස් අත්තේ පුද්ගලයින් 50 දෙනෙකු අතර වේ. මෙම පුද්ගලයන් අතුරින් 38 දෙනෙකුට (76%) කුඹුරු ඉඩම් අක්කර 1 ට වඩා හිමි ව තිබේ. මැදගම ග්‍රාමයේ විශේෂත්වය වන්නේ ගැමියන් කුඹුරු ගොවිතැන් සඳහා දැඩි ඇල්මක් නො දැක්වීම යි. ඔවුන් මූලික වශයෙන් අවධානය යොමු කොට තිබෙන්නේ තේ වගාව කෙරෙහි ය. විශේෂයෙන් පවතින සීමිත කුඹුරු ප්‍රමාණය පවා තට්ටුමාරු හෝ කට්ටිමාරු ක්‍රමයට භුක්ති විඳිනු ලබති. පහළ මැදගම බොහෝ කුඹුරු ඉඩම් හවුල් ඉඩම් වශයෙන් මෙම ක්‍රමයට අනුව වගා කරනු ලැබේ. මේ නිසා අද ගොවිතැනට ඇති ඉඩකඩ ඇහිරී ගොස් ඇත. ඉහළ මැදගම ඇති කුඹුරු ඉඩම් සින්නක්කර අයිතිය ඇති ඉඩම් වන අතර අදාළ ඉඩම් හිමියෝ බොහෝ විට මෙම ඉඩම් වගා කරති. අදවන විට බොහෝ ගොවියන් මහ කන්නයට (ඔක්තෝබර්-නොවැම්බර්) වගා නොකරන බව දක්නට ලැබේ. මන්ද යත් ඔවුන් තමන්ගේ තේ වගාවන් සඳහා දැඩි අවධානයක් යොමු කොට තිබීම යි. ඉහත කරුණු අනුව මැදගම ග්‍රාමයේ ප්‍රධාන ව්‍යාපාරික භෝගයක් වශයෙන් තේ වගාවට පුද්ගලයා යොමු වී ඇති බව දක්නට ලැබේ. සමස්ථයක් වශයෙන් ගත් කල සෑම කෙනෙකුට ම තේ අක්කරයට වඩා වැඩි ප්‍රමාණයක් අයත් වේ.

පහත වගු අංක 4 අනුව වගා කළ සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් 77% ක් පමණ ප්‍රමාණයක් තේ වගාව සඳහා ගැමියෝ යොදාගෙන තිබේ. මීට ඉහත දී පැහැදිලි කළ ආකාරයට තේ වාණිජ බෝග වගාවක් ලෙස ගැමියන් අතර ප්‍රචලිත වීමට තේ සඳහා හොඳ ඉල්ලුමක් පැවතීමත්, භූගෝලීය හා දේශගුණික වශයෙන් යෝග්‍ය තත්වයක් දැකිය හැකි වීමත් විශේෂ ලක්ෂණ වේ. සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව ගැමියන් පුවක්, රබර් හා මිශ්‍ර භෝග වගාවන්ගෙන් ඈත් ව තේ වගාවට නැඹුරු වීමක් අද දක්නට ලැබේ. විශේෂයෙන් සාම්ප්‍රදායික අවධියේ ගැමියන්ගේ තේ දළු අතරමැදියකු හරහා හිනිදුම, තවලම සහ බද්දේගම වැනි තේ කර්මාන්ත ශාලා වෙත ලබා දීමට සිදුවිය, නමුත් මෙහි දී ගැමියන්ට නියම මිලක් නොලැබුණ බව ඔවුන්ගේ අදහස යි. නමුත් 1982 දී ගමට තේ කර්මාන්ත ශාලාව ලැබීම ගැමියන්ට ඉතා වාසිදායක තත්වයක් වී තිබේ. මේ නිසා අතරමැදියකු නොමැති ව තමන්ගේ තේ දළු අළෙවි කර ගැනීමට ගැමියන්ට හැකියාව ලැබී තිබේ. අද වන විට (2006) දළු කිලෝ එකකට රු.45 ක මුදලක් ගෙවනු ලබයි. සාමාන්‍යයෙන් අක්කරයකින් දළු කිලෝ 700 - 800 ක්

අතර ප්‍රමාණයක් මාසයකට කඩා ගැනීමට හැකි බව ගැමියන්ගේ අදහස යි. මේ අනුව වියදම් අත්හළ විටත් ගැමියන්ට විශාල මුදලක් ඉතිරි කරගත හැකි බව දක්නට ලැබේ. දළු කැඩීම සඳහා ගෙවීම් ක්‍රම දෙකකින් සිදු කරයි. කුලියට දළු කැඩීමේ දී දිනකට රු.250 - 300 ක් අතර ගෙවනු ලබයි. නැතිනම් දළු කිලෝ ගානට ගෙවනු ලබයි. මේ අනුව දළු කිලෝ 1 ක් කැඩීම වෙනුවෙන් රු. 8 - 9 ක් අතර ගෙවිය යුතු වේ. මැදගම විශේෂයෙන් දැකිය හැක්කේ පවුලේ ශ්‍රමය මේ සඳහා යොදා ගන්නා බව යි. මේ නිසා ඔවුන්ගේ වියදම අඩු කර ගැනීමට ගැමියන්ට හැකියාව ලැබී තිබේ.

**වගු අංක 4. ඉඩම් පරිභෝජන ප්‍රමාණය, විවිධ වගාවන් අනුව**

| වගාකර ඇති භෝගය | ප්‍රමාණය (අක්කර) | ප්‍රතිශතය |
|---|---|---|
| වී වගාව | 56 | 10.3 |
| තේ | 416 | 76.8 |
| රබර් | 12 | 2.2 |
| කුරුඳු | 04 | 0.7 |
| මිශ්‍ර භෝග | 33 | 6.1 |
| මුඩු බිම් | 21 | 3.9 |
| එකතුව | 542 | 100 |

මූලාශ්‍රය ක්ෂේත්‍ර දත්ත 2006

ඉඩම්වල වටිනාකම ද සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව වර්ධනය වී තිබේ. අද වන විට තේ ඉඩම් අක්කරයක් රු. ලක්‍ෂ 6 ක් පමණ වේ. ගොඩ ඉඩමක් හිස් ඉඩමක් ලෙස මිල දී ගන්නේ නම් රු. ලක්ෂ 3 - 4 ක් පමණ වේ. කුඹුරු ඉඩම් අක්කරයක් රු. ලක්ෂ 2 ක් පමණ වේ. මේ අනුව ඉඩම්වල වටිනාකම ද අද බොහෝ වෙනස් වී ඇති බව පැහැදිලි වේ. ගම තුළ සිදු වූ නවීකරණයත් සමඟ ඉඩම්වල වටිනාකම මෙසේ ඉහළ ගොස් තිබේ. අද ගැමියන්ගේ සමාජ තත්වය ගරුත්වය හා බලය නිරූපණය කරන ප්‍රධාන සාධකයක් බවට ඉඩකඩම් වැදගත් වී තිබේ. මේ නිසා මැදගම ගැමියන් බොහෝ විට තම ප්‍රධානතම ආයෝජන මාර්ගය ලෙස ඉඩම් තෝරාගෙන තිබේ.

ඉඩම් පැවරීම සම්බන්ධයෙන් හෝ විකිණීම සම්බන්ධයෙන් මැදගම පවතින්නේ ලිහිල් ප්‍රතිපත්තියකි. ලීච් අධ්‍යයනය කළ පුල්එළිය ග්‍රාමයේ එකම වර්ගයේ කෙනෙකු අතර ඉඩම් පැවරීම හෝ විකිණීම සිදුවූ තත්වය (Leach, 1961: 130) මැදගම දක්නට නො ලැබේ. මෙය සාම්ප්‍රදායික අවධියේ සිට මැදගම තිබූ තත්වයකි. ඔබේසේකර පවා සඳහන් කරන්නේ මැදගම අවශ්‍ය ඕනෑ ම කෙනෙකුට ඕනෑ ම විටක තම ඉඩම් විකිණීම හෝ පැවරීම කළ හැකි බව යි (Obeyesekere, 1967: 40) නමුත් සාම්ප්‍රදායික අවධියේ බොහෝ සෙයින් යෝජිත විවාහ සිදු වූ අතර එහි දී කාන්තාවන්ට දෑවැද්ද වශයෙන් ඉඩකඩම් ලබා නොදුන් බව ගැමියෝ සඳහන් කරති. දීග විවාහයක දී දෑවද්ද

ක්‍රියාත්මක වුවත් කාන්තාවන්ට ඉඩම් ලබා නොදුන්නේ ඉඩකඩම් පිටස්තර පුද්ගලයන්ට උරුම වීම පිළිබඳ ව ගැමියන් තුළ වූ අකමැත්ත නිසා ය. නමුත් බින්න විවාහයක දී මේ තත්වය වෙනස් වී ඇත. එහි දී එක් ගැහැණු ළමයෙකු පමණක් සිටීම මත සියලු දේපළ හිමිවීම දක්නට ලැබුණි.

අද වන විට විවාහ රටාවන් වෙනස් වී ප්‍රේම සබඳතා මත තීරණය වන තත්වයකට එය ගොඩනැගී පවතී. එමෙන් ම ඉඩම් ඇතැම් විට කාන්තාවන්ට ලබාදෙන අවස්ථා ද දක්නට ලැබේ. මීට අමතරව මිල මුදල් ඇති ඕනෑ ම අයෙකුට ඉඩම් මිල දී ගැනීමට හැකියාව අද උදා වී තිබේ. මැදගම දැකිය හැකි විශේෂත්වය වන්නේ ගමේ ඉඩම් පිටස්තර අය හිමිකර ගන්නවාට වඩා ගැමියන් අතර ම හුවමාරු වීමයි. කෙසේ වෙතත් සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව අද ගමේ ඉඩම් පිටස්තර පුද්ගලයන් හිමිකර ගෙන තිබේ (වගු අංක 05 අනුව) වර්තමාන මැදගම ඉඩම් හිමිකාරත්වය ස්ත්‍රී පුරුෂ වශයෙන් හඳුනාගත හැකි වන්නේ මෙසේය.

ඉහත වගු අංක 5 අනුව සමස්ත ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 467 කි. එම ඉඩම්වල හිමිකාරත්වය ස්ත්‍රී පුරුෂ වශයෙන් ගත් කල සමස්ත ඉඩම්වලින් පුරුෂයන් 258 දෙනෙකු (82%) ක් මුළු ඉඩම්වලින් අක්කර 393 ක් (84%) හිමිකරගෙන තිබේ. කාන්තාවන්ට හිමි ව ඇත්තේ මුළු ඉඩම්වලින් අක්කර 74 කි(16%). එම ඉඩම් සියල්ල කාන්තාවන් 57 දෙනෙකු (18%) අතර බෙදී ගොස් තිබේ. කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් විමසීමේ දී වගු අංක 03 අනුව සමස්ත කුඹුරු ඉඩම් අක්කර 50 කි. මෙම ඉඩම් සියල්ල පිරිමි 50 දෙනෙකු අතර පමණක් බෙදී ගොස් ඇත. මේ අනුව ඉඩම් විකිණීම, මිල දී ගැනීම හෝ පැවරීම සම්බන්ධයෙන් නිදහස් බවක් පැවතිය ද ඉඩම් හිමිකාරත්වය තුළ කාන්තාවන්ට සාපේක්ෂව පිරිමින් ඉදිරියෙන් සිටින බව කිව යුතු ය.

**වගු අංක 5. ගොඩ ඉඩම් හිමිකාරත්වය ස්ත්‍රී පුරුෂ අනුව**

| වර්ගය | පුද්ගල සංඛ්‍යාව | ප්‍රතිශතය | ඉඩම් ප්‍රමාණය අක්කර | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුරුෂ | 258 | 81.9 | 393 | 84.2 |
| ස්ත්‍රී | 57 | 18.1 | 74 | 15.8 |
| එකතුව | 315 | 100 | 467 | 100 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත 2006

ඉහත සමස්ත විග්‍රහය දෙස බැලීමේ දී සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව නූතන මැදගම ග්‍රාමයේ ඉඩම් භුක්තියේ ශීඝ්‍ර වෙනස්වීමක් සිදු ව ඇති බව හඳුනාගත හැකි වේ. ඉඩම් ප්‍රමාණය, භුක්තියේ ස්වභාවය, වගා කරන භෝග, ඉඩම්වල වටිනාකම, හිමිකාරත්වය, සහ ඉඩම් විකිණීම හා පැවරීම යන බොහෝ අංශවල මෙම වෙනස්වීම් හඳුනාගත හැකි වේ.

සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව නූතන මැදගම කුල ක්‍රමයේ යම්තාක් දුරකට වෙනස්වීම් සිදු ව ඇති බව හඳුනාගත හැකි වේ. සාම්ප්‍රදායික අවධියේ (1961) දී මැදගම සියලු දෙනා ම ගොවිකුලය නියෝජනය කරන ලදී. නමුත් අද වන විට ගමට පිටස්තර කුලවල බලපෑම යම්තාක් දුරට දක්නට ලැබේ. මේ තත්වය වඩා හොඳින් අවබෝධකර ගැනීමට වර්තමාන මැදගම කුල සංයුතිය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය.

ඉහත වගු අංක 6 අනුව මැදගම ග්‍රාමයේ සමස්ත ජනගහනයෙන් 96% ක් ගොවිකුලය නියෝජනය කරනු ලබයි. පහත් යැයි සම්මත කුල නියෝජනය කරන පිරිස 4% කි. සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව පහත් යැයි සම්මත කුල කීපයකට අයත් පුද්ගලයෝ අද මැදගම ජීවත් වෙති. විශේෂයෙන් අදවන විට අන්තර්කුල අතර පවතින විවාහ වර්ධනය වී තිබේ. විශේෂයෙන් ප්‍රේම සබඳතා මත විවාහ සිදුවීම හේතු කොට ගෙන පිටස්තර කුලවලට අයත් පුද්ගලයන් ගමට සංක්‍රමණය වී තිබේ. මීට අමතර ව 1977 දී එක්සත් ජාතික පක්ෂය බලයට පත්වීමත් සමඟ තමන්ට සහයෝගය ලබාදුන් පුද්ගලයන්ට නිවාස කන්දෙන් ඉඩම් ලබා දී නිවාස කන්ද නිවාස යෝජනා ක්‍රමය ගොඩ නගන ලදී. මේ හේතුවෙන් ද පිටස්තර කුලවල පුද්ගලයන් ගමට සංක්‍රමණය වී තිබේ. විශේෂයෙන් නිවාස යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ඉඩම් කැබලි මුල් පදිංචිකරුවන් නැවත විකිණීම නිසා එම ඉඩම් කොටස් පිටස්තර කුලවලට අයත් පුද්ගලයින් කිහිප දෙනෙකු මිල දී ගෙන තිබේ. මීට අමතර ව තේ අර්ථ ක්‍රමයත් සමඟ වතුවල කුලී වැඩට පැමිණි ඇතැම් පිරිස් ගමේ කුඩා ඉඩම් කැබලි මිල දී ගෙන අද ගම තුළ ම පදිංචි වී සිටිති. විවෘත ආර්ථිකයත්, අධ්‍යාපනයේ සිදු වූ වර්ධනයත් නිසාත් ගමෙන් පිට රැකියා සඳහා සංක්‍රමණය වූ පිරිස් අන්තර්කුල විවාහ සිදුකරගෙන ගම තුළ පදිංචි වී සිටිති. මැදගම තේ කර්මාන්ත ශාලාව ආරම්භ වීමත් සමඟ ඇඹිලිපිටිය, මිද්දෙණිය, වලස්මුල්ල, ඌරුබොක්ක වැනි ප්‍රදේශවල පිරිස් තේ කර්මාන්ත ශාලාවේ වැඩට පැමිණි අතර ගමේ අය ඒ පුද්ගලයන් සමඟ විවාහ වී සිටින අයුරු ද දැකිය හැකි වේ. මේ නිසා සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂව කුල සංයුතියේ වෙනසක් දැකිය හැකි වේ. මේ තත්වය මත සාම්ප්‍රදායික අවධියේ පැවති වාසගම්වලට අමතරව,

- විජයමුනි දුරගේ
- අගම්පොඩි
- වලාකුළු ගමගේ
- පත්තිනි අන්දාදිගේ
- පත්තිනි දේවගේ
- ලෙව්පොත් දෙනියගේ

වැනි වාසගම් අද ගම තුළ දක්නට ලැබේ.

සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව කුලයේ තිබූ වෘත්තීය රටාවන් අද වෙනස් වී තිබේ. මැදගම හඳුනාගත හැකි මෙම පහත් යැයි සම්මත කුලවලට අයත් පිරිස් රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වෙති. බොහෝ දෙනා කුඩා හෝ තේ ඉඩමක හිමිකරුවෙක් වෙති.

අධ්‍යාපන අවස්ථාවන් පුළුල් වීමත් සමඟ සියලු දෙනාට කුල භේදයකින් තොර ව සාධික අධ්‍යාපනය ඔස්සේ ඉහළ වරප්‍රසාද භුක්ති විඳීමට හැකි වී තිබේ. මේ නිසා වර්තමාන මැදගම ග්‍රාමයේ ඉහත පහත් යැයි සම්මත කුලවලට අයත් පිරිස් ඉහළ රැකියා අවස්ථා වෙත ළඟා වී තිබේ.

**වගු අංක 6. වර්තමාන මැදගම කුල සංයුතිය**

| කුලය | ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| ගොවිගම | 1008 | 96.4 |
| බෙරව | 04 | 0.4 |
| රදව් | 14 | 1.3 |
| වහුම්පුර | 04 | 0.4 |
| හලාගම (හාලි) | 03 | 0.3 |
| දුරාව | 11 | 1.0 |
| කරාව | 02 | 0.2 |
| එකතුව | 1046 | 100.00 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර දත්ත 2006
කුල ජනගහනය අවුරුදු 18 ට වැඩි

සාම්ප්‍රදායික අවධියේ අන්තර්කුල විවාහ සිදු නොවුණ අතර එසේ සිදුවුවහොත් එය කුල තහංචි කැඩුවකු සලකා කුලයෙන් නෙරපීමට තරම් හේතු විය. නමුත් නූතනයේ පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන් ආර්ථික අතින් ශක්තිමත් සහ සමාජ නවීකරණයත් සමඟ කුල භේදයට සමාජය තුළ තිබූ වටිනාකම අඩුවීම නිසා අන්තර්කුල විවාහ වැඩි වශයෙන් සිදුවන බව හඳුනාගත හැකි ය.

අද වන විට මැදගම ග්‍රාමයේ වාසගම යම් පමණකට කුලය හඳුනා ගැනීමට හේතු වුවත් යොදා ගනු ලබන පුද්ගල නාම සියලු ම කුල පොදුවේ භාවිත කරයි. මැදගම ග්‍රාමයේ විවිධ කුලවලට අයත් පුද්ගලයන් හැඳින්වීම සඳහා යොදන පුද්ගල නාම මෙසේ ය.

| | | |
|---|---|---|
| ගොවිගම | - | ජයරත්න, අජිත්, නිමාලි, අනුර, වින්ධ්‍යා |
| බෙරව | - | නන්දාවතී, සුනිල්, කමලාවතී, හර්ෂා |
| හලාගම | - | සුගත්, ගුණවතී, නිරෝෂා |
| දුරාව | - | ශාන්ත, ස්වර්ණලතා, සීතා, නිමල් |
| රදව් | - | මල්ලිකා, කාන්ති, උපුල්, අරුණ |

මේ ආකාරයට වර්තමාන මැදගම ග්‍රාමයේ සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව කුල ක්‍රමයේ යම් යම් වෙනස්වීම් සිදු ව ඇති බව පැහැදිලි වේ. මෙය තවදුරටත් හඳුනා ගැනීමේ දී ඉඩම් භුක්තිය සම්බන්ධයෙන් මෙම වෙනස්වීම් තවදුරටත් දැකිය හැකි වේ. සාම්ප්‍රදායික අවධියේ ගමේ සියලු ඉඩම් ගොවි කුලය සතු විය. නමුත් අද වන විට

එය යම් තරමකට වෙනස් වී පහත් යැයි සම්මත ඇතැම් කුලවල පිරිස් ගමේ ඉඩම්වල පදිංචි වී සිටිති. මේ තත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට ඒ ඒ කුලයන් අතර ඉඩම් බෙදී ගොස් ඇති ආකාරය විමසා බැලීම වැදගත් වේ.

ඉහත වගු අංක 7 අනුව වර්තමානයේ ඉඩම් හිමිකාරත්වය තුළ සමස්ත කුඹුරු ඉඩම් ප්‍රමාණය ම (අක්කර 56) ගොවිකුලය සතු වේ. ඊට අමතර ව ගොඩ ඉඩම් අක්කර 467 න් අක්කර 451 ක් ම ගොවිකුලය සතු ව පවතී. මේ නිසා ඉඩම් හිමිකාරත්වයේ සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැති බව පෙනී යයි. නමුත් සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව පහත් යැයි සම්මත කුල කීපයක් ගමේ ගොඩ ඉඩම් අක්කර 19 ක් හිමිකරගෙන තිබේ.

**වගු අංක 7. වර්තමාන මැදගම කුලය සහ ඉඩම් හිමිකාරත්වය**

| කුලය | කුඹුරු ඉඩම් අක්කර | ඉඩම් හිමියන් සංඛ්‍යාව | ගොඩ ඉඩම් අක්කර | ඉඩම් හිමියන් සංඛ්‍යාව | මුළු ජනගහනය |
|---|---|---|---|---|---|
| බෙරව | | | 1 1/4 | 02 | 05 |
| රදව් | | | 3 1/4 | 07 | 14 |
| වහුම්පුර (හකුරු) | | | 5 | 03 | 04 |
| හලාගම | | | 1.5 | 02 | 03 |
| දුරාව | | | 2.5 | 06 | 11 |
| කරාව | | | 2.5 | 02 | 02 |
| ගොවිගම | 56 | 50 | 451 | 293 | 1007 |
| එකතුව | 56 | 50 | 467 | 315 | 1046 |

මේ ආකාරයට සාම්ප්‍රදායික අවධිය තුළ පහත් යැයි සම්මත කුලවලට ගමේ ඉඩම් හිමි නොවුණ ද අද එම තත්වය යම් තරමක් දුරට වෙනස් වී තිබේ. කුල ක්‍රමය හා බැඳුණු කහංචි මතවාද අභාවයට යමින් නූතන සමාජ නවීකරණයත් සමඟ අධ්‍යාපනය, රැකියාව, විවාහය වැනි සාධක මත පිටස්තර කුලවලට අයත් පුද්ගලයෝ ගමේ ඉඩම් යම් තරමක් හිමිකරගෙන තිබේ.

මුලින් සඳහන් කළ පරිදි කුලයක් සමඟ තිබූ වෘත්තීමය බැඳීම් අද ලිහිල් වී තිබේ. බෙර වැයීම, රෙදි සේදීම වැනි රාජකාරි අද ගම තුළ ඒ ඒ කුල විසින් සිදු නො කරයි. රෙදි තමන් විසින් ම සෝදා ගනු ලබන අතර මරණයක දී මගුලක දී සිදුවන බෙර වැයීම අද ගමේ තරුණයෝ එකතු වී සිදු කරති. විශේෂයෙන් එක්සත් අවමංගල්‍යාධාර සමිතිය මගින් මේ සියලු කටයුතු සිදු කෙරෙයි. සාම්ප්‍රදායික ව පැවති චාරිත්‍ර වාරිත්‍ර අභාවයට ගොස් ඇති බැවින් ඒ ඒ කුලවලට පැවරුණු රාජකාරි ඉටු කිරීමත් අදවන විට අවශ්‍ය වන්නේ නැත. මේ නිසා පහත් කුලවල පිරිස් ආර්ථික හා සමාජීය අතින් ඉදිරියට පැමිණ තිබේ. මීට සමගාමී ව ඉඩම් සම්බන්ධයෙන් පැවති බාධක ලිහිල් වීම තුළ පහත් කුලවල පිරිස් ගමේ ඉඩම් මිල දී ගෙන ගැමියන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලබති.

කෙසේ වෙතත් මැදගම ග්‍රාමයේ ඇති සමාජීය පසුබිම තුළ ගැමියන්ගේ ඉඩම් පිටස්තර පුද්ගලයන් අතට පත්වීම සීමිත වී තිබේ. මේ සඳහා බොහෝ විට මැදගම දූනටත් සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයක් වීම හේතු විය හැකි ය. ආසන්නයේ ඇති ප්‍රධාන නගරය නෙළුව වුවත් අදටත් ඉතා දුෂ්කර මාර්ගයක් ගෙවා නෙළුවට හෝ මැදගමට ළඟාවිය යුතු ය. භෞතිකමය අතින් සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව ශීඝ්‍ර දියුණුවක් පෙන්නුම් කළ ද ගැමියන් තුළ පවා ගම සම්බන්ධයෙන් පවතින්නේ නිශේධනාත්මක ආකල්පයකි. මැදගම ග්‍රාමයේ වර්තමානය වන විට බොහෝ දෙනෙක් තම දූ දරුවන් ගාල්ල, කළුතර ආදී ප්‍රදේශවල නතර කොට වැඩිදුර අධ්‍යාපනය ලබා දෙති. පෞද්ගලික පංති සඳහා ගාල්ල, කළුතර ආදී නගරවලට බොහෝ දෙනෙක් අදටත් ඇදී යති. ඔවුන්ගේ අදහස වන්නේ නෙළුව, මැදගම අදටත් දුෂ්කර ප්‍රදේශයක් බව යි. මේ නිසා ඉඩම් පිටස්තර පුද්ගලයන් සතු වීම යම් තරමකට සීමා වී තිබේ.

අද වන විට වාණිජ භෝග වගාවක් වශයෙන් තේ වගාව ගමේ ප්‍රධාන ආදායම් මාර්ගය වී තිබේ. තේ ඉඩමක් හිමි කෙනෙක් තමාගේ ඉඩම තව කෙනෙකුට විකිණීමට කිසිදු අවස්ථාවක උනන්දු නොවේ. මැදගමට කිලෝමීටර් 14 පමණ එපිටින් වූ කඩිහිංගල වැනි ප්‍රදේශවලින් පවා ගැමියෝ ඉඩම් මිල දී ගෙන තිබේ. මේ නිසා ගමේ ඉඩම් බාහිර පුද්ගලයන් අතට පත්වීමක් දැකිය හැකි නොවේ. මේ ආකාරයට සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව මැදගම ග්‍රාමයේ නූතනය වන විට ඉඩම් භුක්තියේ සහ කුල නියෝජනයේ යම් බඳු විපර්යාසයන් සිදු ව ඇති බව පැහැදිලි වේ.

## නිගමනය

මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය වූයේ කුලය සහ ඉඩම් භුක්තිය අතර පවතින සබඳතාව කෙබඳු දැයි හඳුනා ගැනීම යි. මෙම මූලික පරමාර්ථය තවදුරටත් විග්‍රහ කර ගැනීමේ දී පහත සඳහන් කරුණු අනාවරණය කර ගත හැකි විය.

මේ අනුව, සාම්ප්‍රදායික අවධියේ කුලය සහ ඉඩම් භුක්තිය අතර, පැවැති සබඳතාව හඳුනා ගැනීමේ දී කුල භේදය එකල ඉතා හොඳින් පැවැති අතර, ඉඩම් බෙදී යාමේ දී ද මේ තත්වය දක්වන ලැබුණි. විශේෂයෙන් ගමේ එක ම කුලය වශයෙන් ගොවි කුලය ක්‍රියාත්මක වූ බවත් සියලු ම ඉඩකඩම් ඔවුන් සතු වූ බවත් කිව යුතු ය. ගමේ ඉඩම් පිටස්තර කුලවල පුද්ගලයන්ට හිමි වීම සම්බන්ධයෙන් ගැමියන් තුළ සතුටක් නො පැවැතුණි. බල ව්‍යුහය තුළ ද සියලු තනතුරු ගොවි කුලයට අයත් පුද්ගලයන් සතු විය. ගමෙන් පරිබාහිරව පිටස්තර කුලවලට අයත් පුද්ගලයන් ජීවත් වූ අතර, අවශ්‍යතාවල දී ඔවුහු ගම්වැසියන් සමග කටයුතු කළහ. විශේෂයෙන් ආමන්ත්‍රණයේ දී ආහාර ගැනීමේ දී, අසුන් ගැනීමේ දී සහ විවාහයේ දී කුල බලපෑම් වඩා හොඳින් දක්නට ලැබුණි. පහත් කුලවල පිරිස් සාම්ප්‍රදායික ව තමන් සම්බන්ධ වූ වෘත්තීමය තත්වයන් ඔස්සේ කටයුතු කළ අතර, ඔවුන්ගේ ආර්ථික ශක්තිය එතරම් යහපත් නොවීමත් ගොවිකුලයට අයත් පිරිස් තම ඉඩම් පිටස්තරයන්ට ලැබීමට එකඟ නොවීමත් වැනි කරුණු මත පහත් යැයි සම්මත කුලවල පුද්ගලයන්ට ගමේ ඉඩම් හිමි කර ගැනීම අපහසු විය.

මීට අමතර ව මෙම අධ්‍යයනයේ දී මීට දශක කීපයකට පෙර පැවැති කුලය සහ ඉඩම් භුක්තිය අතර, තිබු සබඳතාව නූතනය වන විට වෙනස් වී ඇති ආකාරය හඳුනා ගැනීමට ද අපේක්ෂා කරන ලදී. මෙහි දී අද වන විටත් ගොවි කුලය ප්‍රමාණාත්මක ව ඉහළින් සිටින අතර, ඉඩම් හිමිකාරත්වය අතින් ද ඉහළින් සිටින බව දක්නට ලැබේ. නමුත් සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව පහත් යැයි සම්මත කුල කීපයකට අයත් එනම් රජක, වහුම්පුර, රදා බෙරව, දුරාව, සලාගම වැනි කුල කීපයකට අයත් පුද්ගලයෝ කිහිප දෙනෙක් ගමේ ඉඩම් හිමිකර ගෙන තිබේ. බල ව්‍යුහය පිළිබඳ විමසීමේ දී විවිධ තනතුරු ආදිය පහත් කුලවලට අයත් පුද්ගලයන්ට හිමි ව තිබෙන අයුරු දක්නට ලැබේ. නමුත් පහත් කුලවල පුද්ගලයන්ට ඇති සමාජ ගරුත්වය වෙනස්වීමට භාජනය වී නොමැති බව පෙනී යයි. ඉඩම් හිමිකාරත්වය තුළ වුව ද ඔවුන්ට ඇත්තේ ඉතා සීමිත ඉඩම් ප්‍රමාණයකි. මීට අමතර ව ආමන්ත්‍රණය, අසුන් ගැනීම, විවාහය වැනි සමාජීය තත්වයන් කුල බලපෑම්වලින් නිදහස් වී ඇති බව දක්නට ලැබේ. කුලය හා බැඳී පැවැති වෘත්තීමය තත්වයන් පැහැදිලි ව වෙනස් වී තිබේ. වාණිජ බෝග වගාවක් ලෙස තේ වගාව ස්ථාපිත වීමත් සමග සිදු වූ ආර්ථික ප්‍රසාරණය මත සියලු දෙනා ම තේ වගාවේ කොටස්කරුවන් වී තිබේ. මෙවැනි පසුබිමක සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව වර්තමානයේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර සබඳතාව කිසියම් දුරකට වෙනස් වී ඇති බව කිව යුතු ය. පහත් යැයි සම්මත කුලවලට හිමි ඉඩම් ප්‍රමාණය සැලකීමේ දී එම ප්‍රමාණය එතරම් සැලකිය යුතු ප්‍රමාණයක් නොවන බව දක්නට ලැබේ. ගමේ සමස්ත ඉඩම් ප්‍රමාණය සැලකීමේ දී ගොඩ ඉඩම් අක්කර 467 ක් ද, කුඹුරු ඉඩම් අක්කර 56 ක් ද දක්නට ලැබේ. නමුත් මෙම සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් පහත් යැයි සම්මත කුලවලට හිමි ව ඇත්තේ ගොඩ ඉඩම් අක්කර 16 (3.4%) කි. එමෙන් ම පහත් යැයි සම්මත කුලවලට ගමේ කුඹුරු ඉඩම් කිසිදු ප්‍රමාණයක් හිමි ව නැත. මෙම තත්වයට හේතු වශයෙන් හඳුනාගත හැකි වන්නේ ගමේ පාරම්පරික ඉඩම් හිමියන් තේ වගාව සමග සෘජු ව ම බද්ධවීමත් එම නිසා ඔවුන් තමන්ගේ ඉඩම් විකිණීමට කැමැත්තක් නොදැක්වීමත් ය. ඊට අමතර ව භූගෝලීය වශයෙන් ප්‍රදේශය තුළ පවතින දුෂ්කර පරිසරය ද ඉඩකඩම්වල වටිනාකම අඩුවීමට හේතු වී ඇති බවත් මේ නිසා බොහෝ පිටස්තර ගැනුම්කරුවන් මෙම ප්‍රදේශයෙන් ඉඩම් මිල දී ගැනීමට මැලිකමක් දක්වන බවත් පැහැදිලි වේ. නමුත් කන්ද උඩරට සමාජය තුළ මෙම තත්වය මීට වෙනස් වේ. විශේෂයෙන් තෙරිපැහැ ග්‍රාමය ගත් විට යාල්මාන් අධ්‍යයනය කළ කාලයට සාපේක්ෂ ව (1967) වර්තමානය වන විට පහත් යැයි සම්මත කුලවලට විශාල ඉඩම් ප්‍රමාණයක් හිමි ව තිබේ (Karunathilake, 2001). නමුත් පහත රට ප්‍රදේශයේ ග්‍රාමීය පරිසරය විමසීමේ දී ඉඩම් හිමිකාරත්වය සහ කුල නියෝජනය පැහැදිලි වෙනසකට භාජනය වී නොමැති බව දක්නට ලැබේ.

මෙවැනි පසුබිමක මේ වන විට මැදගම ග්‍රාමය තුළ පහත් යැයි සම්මත කුලවල කිහිප දෙනෙකු ඉඩම් හිමියන් වශයෙන් හඳුනාගත හැකි වේ. ඊට අමතර ව රජයේ ඉහළ රැකියාවන්හි නියුතු පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන් ගමේ ඉඩම් හිමියන් වශයෙන් දක්නට ලැබේ. බොහෝ විට මොවුහු විවාහය, රැකියාව, රජයෙන්

ලබා දුන් ඉඩම් ආදී කරුණු හේතු කොට ගෙන ගමේ පදිංචි ව සිටිති. මේ ආකාරයට කුල ධුරාවලියේ පහළ සිටින කුල කිහිපයකට ඉඩම් හිමි ව තිබුන ද එය සැලකිය යුතු ප්‍රමාණයක් නොවන බව පැහැදිලි වේ. 1961 වර්ෂයේ දී ගමේ මුළු ඉඩම් ප්‍රමාණය ගොඩ ඉඩම් අක්කර 60 ක් සහ කුඹුරු ඉඩම් අක්කර 40 ක් පමණ වේ. මෙකල පහත් යැයි සම්මත කිසිදු කුලයකට ඉඩම් හිමි ව නො තිබුණි. නමුත් 2006 වන විට ගමේ ඉඩම් ප්‍රමාණය ගොඩ ඉඩම් අක්කර 467 ක් සහ කුඹුරු ඉඩම් අක්කර 56 ක් දක්වා වර්ධනය වී තිබේ. මෙම වර්ධනය 1961 ට සාපේක්ෂ ව කුඹුරු ඉඩම් 40% න් වර්ධනය වී ඇති අතර ගොඩ ඉඩම් 678% න් වර්ධනය වී තිබේ (වගු අංක 01). ගමේ ඉඩම් ප්‍රමාණය මේ ආකාරයට වර්ධනය වුව ද අද වන විට ගමේ ජීවත් වන පහත් යැයි සම්මත කුලවලට හිමි ව ඇත්තේ ගමේ සමස්ත ඉඩම් ප්‍රමාණයෙන් 3.6% ප්‍රමාණයකි. සෙසු සියලු ඉඩම්වල හිමිකාරත්වය ගොවි කුලය සතු වේ. මේ නිසා මැදගම ග්‍රාමයේ ඉඩම් හිමිකාරත්වය සම්බන්ධයෙන් විමසන විට අදටත් ගොවි කුලය ඉතා වැදගත් හා ශක්තිමත් පිරිස වශයෙන් හඳුනාගත හැකි වේ.

ඉහත සමස්ත විග්‍රහය දෙස අවධානය යොමු කිරීමේ දී ගැමි සමාජ නවීකරණයත් සමග ගම තුළ විවිධ වෙනස්වීම් සිදු ව ඇති බවත් විශේෂයෙන් කුලය හා බැඳුනු තහංචි හා මතවාද යම් ප්‍රමාණයකට අහෝසි වී ගොස් පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන්ට ද සමාජයේ ඉහළ අතට චලනය වීමට ඉඩ ප්‍රස්තා ලැබී තිබෙන අයුරුත් දක්නට ලැබේ. නමුත් කුලය සහ ඉඩම් හිමිකාරත්වය සම්බන්ධයෙන් පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික අවධියට සාපේක්ෂ ව ගම තුළ සැලකිය යුතු වෙනසකට භාජනය වී නොමැති බව යි. මේ නිසා පුද්ගලයාගේ සමාජ තත්ත්වය (social statu) පිළිබිඹු කරන ඉඩම් හිමිකාරත්වය වැනි සාධක හමුවේ කුල බලපෑම් නූතන සමාජයේත් ශේෂ ව පවතින බව නිගමනය කළ හැකි වේ.

## පරිශීලිත මූලාශ්‍රයෝ

කරුණාතිලක, කේ. (1998) සමාජ විද්‍යා න්‍යාය, කඩවත, මාලිංග ප්‍රකාශකයෝ

කොඩ්රිංටන්, එච්. ඩබ්. (1980) ලංකාවේ පුරාණ ඉඩම් භුක්තිය හා ආදායම, කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව.

පීරිස්, රැල්ප් (1964) සිංහල සමාජ සංවිධානය, බණ්ඩාරගම, සමන් ප්‍රකාශකයෝ, (පළමු මුද්‍රණය 1956).

Davy, J. (1983) An Account of the Interior of Ceylon and its inhabitants, Dehiwala : Tissara Prakashakayo Ltd.

D'oyly, J. (1995) Diary of Mr. John D'oyly, Colombo: Navrang in Collaboration with Lake House Book Shop.

Karunathilake, K. (2001) Changes in the Rural Society of Sri Lanka: A Social Anthropological Study of the Village Teripaha. Unpublished PhD Thesis, Jawaharlal Nehru University. New Delhi: India

Leach, E. R. (1961) Pul Eliya : A Village in Ceylon, Cambridge: Cambridge University Press.

Obeyesekere, G. (1967) Land Tenure in Village Ceylon, Cambridge: Cambridge University Press.

Ryan, B. (1993) Caste in Modern Ceylon, New Delhi: Navrang.

Skinner, T. (1995) Fifty years in Ceylon, New Delhi, Madras:, Asian Education Services.

Spencer, J. (1990) A Sinhala Village in a Time of Trouble, New Delhi : Oxford University Press.

Tambiah S.J. (1958) The structure of Kinship and its relation to land possession and residence in Patadumbara, central province, UK, Journal of the Royal Anthropological Institute.

Yalman, N. (1967) Under the Bo Tree: Studies in Caste, Kinship and Marriage in the Interior of Ceylon, Berkeley and Los Angeles: University of California Press.